# ඩාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

41 වන කාණ්ඩය | 02 වන කලාපය | 2025 ජනවාරි කලාපය


# 2025 නව වසර සැමරීම







2025 නව වසර සඳහා කිරි ඉතිරවීම සහ වැඩ ආරම්භ කිරීම මෙවරත් ජනවාරි මස පළවෙනි දින ඩාබිඳු සාමූහිකයේ නිර්මාතෘ සමන්මලී හෙට්ටිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් සමඟ එක්ව කටුනායක ඩාබිඳු කාර්යාලයේදී සමරනු ලැබීය.

නව වසරේ වැඩ ආරම්භ කරමින් බියගම ඩාබිඳු කාර්යාලයේ කිරි ඉතිරවීම ජනවාරි මස පස් වන දින පවත්වන ලදී. එහිදී ඩාබිඳු සාමූහිකයේ කාර්යය මණ්ඩලයත්, ඩාබිඳු සාමූහිකගේ බියගම සාමාජිකයනුත් එක්ව නව වසර සමරන ලදී.

මෙහි විශේෂත්වයක් වූයේ බියගම ඩාබිඳු සාමාජිකයින් විසින් ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතයෙන් පොල්තෙල් පහනක් සහ සැරසිලි වලින් බියගම කාර්යාලය ඉතා අලංකෘත ලෙස සැරසීමයි. මෙය ඔවුන්ගේම කර්තවයක් ලෙස සිතමින් නව වසර සැමරීමට එක්වීම ඩාබිඳු සාමූහිකය ලෙස අප පසුගිය වසරවල් පුරාම යෙදූ පරිශ්‍රමයන්වල ජයග්‍රහණයක් ලෙස කිව හැකිය.

2 වන පිටුවට...

## ඇතුළු පිටු


**03 පිටුව** - කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ දින 16යේ ක්‍රියාකාරීත්වය

**04 පිටුව** - නව පර්යේෂණ වාර්තාව

**05-06 පිටු** - අපේ වැඩ

**07-08 පිටු** - ජාතික හා ජාත්‍යන්තර වැඩ

**09 පිටුව** - සංස්කෘතික ගැහැනියගෙන් ඔබ්බට

**10 පිටුව** - සිතුවිල්ල/ප්‍රහේලිකාව

**11 පිටුව** - කවි පිටුව/සමාජ ආරක්ෂාව


**නිදහස් වෙළඳ කලාපයේ ඉපැරණිම පුවත්පත**

## ඩාබිඳු සාමූහිකය
221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective

# ඩාබිඳු සාමූහික සංගමය ජාතික කම්කරු උපදේශක සභාවට

ජාතික කම්කරු උපදේශක සභාව නියෝජනය කිරීමට ඩාබිඳු සාමූහික සංගමයට අවස්ථාව උදාවීම අපගේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වයේ ජයග්‍රහණයක් බව සතුටින් ප්‍රකාශ කරමු. 1984 වසරේ සිට ඇඟළුම් කර්මාන්ත කම්කරුවන් වෙනුවෙන් විවිධ බාධක හා තර්ජන මැද අප ආ ගමන් මගේ සන්ධිස්ථානයක් බව මෙම අවස්ථාව සදහන් කළ යුතුය. බහුතර කාන්තා නියෝජනයක් සහිතව පවතින ඇඟළුම් ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීමට ඇති නීතිමය තත්ත්වයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම, අඩු වැටුප්, සංක්‍රමණය වීමට සිදුවීම, හිංසනයන්ට හා ප්‍රචණ්ඩත්වයට ලක් වීමට සිදුවීම, වෘත්තීය සෞඛ්‍ය හා බැඳුනු ගැටලු, ආර්ථික හා සමාජීය මෙන්ම සංස්කෘතික ගැටලු වලට හා නායකත්වය පිළිබඳ වූ ගැටළු වලටද දශක හතරකට අධික කාලයක් පුරාවට මෙම කම්කරුවන්ට මුහුණ පෑමට සිදුවිය.

සිය රැකියාව වෙනුවෙන් කළ කැප කිරීම වෙනුවෙන් වන දායකත්වයට සාධාරණ වූ වේදිකාවක් ඔවුන් වෙනුවෙන් ගොඩනැගුණේ නැත. පුරුෂ මූලික සමාජ ක්‍රමය තුළ ඔවුන්ටම විශේෂිත වූ ගැටලු සම්බන්ධයෙන් අවධානයට ලක් වූයේ නැත. සමාජ භාවීය ගැටළු තීන්දු ගන්නා තැන්වල අවධානය යොමු වූයේ නැත. ක්‍රියාශීලී කම්කරුවන් ලෙස මව්වරුන් ලෙස ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වයට පවතින නීතිවල රැකවරණය මෙන්ම ජාත්‍යන්තර නීතිවලද පවතින ආරක්ෂණය අහිමිව සේවා පරිසරය තුළ විවිධ දුක්ගැහැට වලට ලක් වෙමින් සේවය කිරීමට සිදුවිය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ වගකිවයුතු පාර්ශවයන් ඔවුන්ගේ අයිතීන් හුදෙකලා කොට හාම්පුතා සතුටු කරන ක්‍රියාමාර්ගවලට මෙන්ම නිතරම ඔවුන්ගේ දුක්ගැනවිල්ලට පමණක් අවධානය යොමු කරන තත්ත්වයක් දක්නට ලැබුණි.

1994 වසරේ ආරම්භ කරන ලද ජාතික කම්කරු උපදේශක සභාවේ 2021 දක්වා කිසිදු කාන්තා නියෝජනයක් දක්නට ලැබුණේ නැත. ආයතන වල වෘත්තීය සමිති ක්‍රියාත්මක වීම ඉතාමත් අල්ප මට්ටමේ පවතින තත්ත්වයක් තුළ ද, පුරුෂ මූලික සමාජ තත්ත්වයක් තුළ ද කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිතියක් ලෙස කම්කරු කාන්තාවන්ගේ අයිතීන් තහවුරු කිරීම වෙනුවෙන් මැදිහත් වීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් ඩාබිඳු සාමූහිකය ලෙස හද පිරි සතුට පල කරන්නෙමු.

1 පිටුවෙන්...

## 2025 නව වසර සැමරීම

උදා වූ 2025 නව වසර සියලුම ශ්‍රී ලාංකිකයන්ටත්, විශේෂයෙන්ම වෙළඳ කලාපවල වෙහෙස මහන්සි වී වැඩ කරන සේවකයින්ටත් සුභම සුභ නව වසරක් වේවා යැයි ඩාබිඳු සාමූහිකය විසින් සුභපැතුම් එක්කරන අතර ආර්ථික අරගල සහ අභියෝග හමුවේ යුක්තිය, සාධාරණත්වය සහ ගෞරවය සඳහා අපගේ හඬ වැඩි කරමින් එකට සිටීමට, සේවක අයිතිවාසිකම් සුරැකීමට කටයුතු කරන සහ දීප්තිමත් අනාගතයත් සඳහා මෙම වසර ආශිර්වාදයක් වේවා යැයි ප්‍රාර්ථනා කරමු.

ගෝලීය ආර්ථික අර්බුදය තුළ, තුන්වන පන්තියේ රටක් ලෙස මෙන්ම ලේබල් කිරීමේ අභියෝග සමඟ පොරබදමින් සිටින ජාතියක් ලෙස, අපි දැවැන්ත අරගලවලට මුහුණ පාමින් සිටී. එහෙත් මෙම දුෂ්කරතා තුළ නැගී සිටීමට, අසමානතාවයට අභියෝග කිරීමට සහ යුක්තිය ඉල්ලා සිටීම සඳහා ශක්තිමත්ව කටයුතු කිරීමට අප මෙම නව වසරේදී අදිටන් කරගමු.











# කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ දින 16 යේ ක්‍රියාකාරීත්වය - 2024

සෑම කාන්තාවන් පස් දෙනෙකුගෙන් එක් අයෙක් තම සමීප සහකරුවෙකුගේ අතින් ලිංගික මෙන්ම ශාරීරික හිංසනයට ලක්වෙති. එවැනි ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන කාන්තාවන් පස් දෙනෙකුගෙන් තුන් දෙනෙක්ම විධිමත් උපකාරක සේවාවන් ලබා නොගනී. ඒ අනුව මෙම සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ ව්‍යාප්ත ස්වභාවය සහ එයට විසඳුම් සෙවීමේ හදිසි අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි මතක් කිරීමක් මෙම දින 16 යේ ක්‍රියාකාරී වැඩසටහන තුළින් සිදු කෙරුණි.

2024 කාන්තා ප්‍රචණ්ඩත්වයට එරෙහි ක්‍රියාකාරීත්වයේ දින 16 යේ තේමාව සුරක්ෂිත පොදු අවකාශයක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. ඊට ප්‍රතිචාර වශයෙන් කටුනායක, බියගම, සහ වවුනියාව යන ප්‍රදේශවල නිහඬ පාගමන් මාලාවක් ඩාබිඳු සාමූහිකය මඟින් සංවිධානය කළ අතර, එය පොදු ස්ථානවල හිංසනයට එරෙහිව කාන්තාවන්ගේ නිහඬ විරෝධය සංකේතවත් කරයි. කාන්තාවන් බොහෝ විට ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර නිහඬව විඳ දරාගන්නා බවත්, සෑම කෙනෙකුටම ආරක්ෂිත විය යුතු පොදු ස්ථානවල සැබෑ යථාර්තය මෙම නිහඬ පාගමන් මගින් අවධාරණය කරන ලදී.

පළමු පාගමන 2024 නොවැම්බර් මස 27 වැනි දින කම්කරුවන් නිතර ගැවසෙන ප්‍රදේශයක් වන කටුනායක නිදහස් වෙළඳ කලාපයේ 6 වැනි ගේට්ටුව (හයේ ගේට්ටුව) අසල දී පැවැත්විණි. 2024 දෙසැම්බර් මස 01 වන දින වවුනියාව සහ බියගම යන ප්‍රදේශවල පා ගමනින් අනතුරුව, එම මස 07 වන දින ඇවරිවත්ත ඔරලෝසු කණුව අසල අවසන් පා ගමන පැවැත්විණි. මෙම ස්ථාන අප තෝරාගෙන ඇත්තේ කාන්තාවන් නිතර හිරිහැර හා ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන ප්‍රදේශයන් ඉස්මතු කිරීමට වන අතර මෙම ගැටලුව කෙරෙහි මහජන සහ ආයතනික අවධානය යොමු කිරීමේ අරමුණින් ය.

දැනුවත් කිරීමේ උත්සාහයන්ට අමතරව ඩාබිඳු සාමූහිකය කාන්තා සේවිකාවන්ට ප්‍රචණ්ඩත්වයට සහ හිරිහැරවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සම්පත් පිළිබඳ ප්‍රායෝගික දැනුවත්භාවයක් ලබා දුන්නේය. පොලිසිය, නීතිය ක්‍රියාත්මක කරන ආයතන, සහ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අයට ආධාර සපයන මධ්‍යස්ථාන ජාලයක් වන මිතුරු පියස වැනි රාජ්‍ය සහාය පද්ධති පිළිබඳ තොරතුරු මෙයට ඇතුළත් විය.

2024 ව්‍යාපාරයේ ප්‍රධාන පණිවිඩය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නොයෙක් ආකාරවලින් පවතින අතර, ඒවායින් සමහරක් සාමාන්‍යකරණය කර හෝ නොසලකා හරිනු ලැබේ. මෙම ප්‍රචණ්ඩත්වය හඳුනා ගැනීම, ඒවාට අභියෝග කිරීම, සහ ඒවායෙන් දිවි ගලවා ගත් අයට සහාය වීම ඉතා වැදගත් වේ. **"නිශ්ශබ්දතාවය බිඳ දමන්න, ප්‍රචණ්ඩත්වය අවසන් කරන්න, කාන්තාවෝ විශ්වාස කරන්න"** යන සටන් පාඨය පදනම් කර ගෙන කාන්තාවන්ට සවන් දීමට, ඔවුන්ගේ අත්දැකීම් විශ්වාස කිරීමට සහ සුරක්ෂිත සමාජයක් නිර්මාණය කිරීම සඳහා සාමූහිකව කටයුතු කිරීමට අපි සමාජයෙන් ඉල්ලා සිටිමු.

මධුලිකා ගුණවර්ධන




# නව පර්යේෂණ වාර්තාව

## බියගම සහ කටුනායක නිදහස් වෙළඳ කලාපවල මිනිස්බල සේවකයින්ගේ තත්ත්ව වාර්තාව

2024 මානව හිමිකම් දිනය නිමිති කර ගනිමින් Court Rights, Our Future, Right Now තේමාව යටතේ BMICH හි දී උත්සවයක් පැවැත් වූ අතර එහි දී ඉතාමත් වැදගත් වාර්තා කිහිපයක් එළි දක්වන ලදී. මිනිස් බල (Man Power) සේවකයන්ගේ තත්ත්ව පිළිබඳ සමීක්ෂණ වාර්තාවක් ද ඒ අතර විය. එය සංවිධානය නොවූ, අවධානයට ලක් නොවූ, ආන්තිකරණයට ලක් වූ, ආර්ථිකයට සුවිශාල කාර්යභාරයක් ඉටු කරන ප්‍රජාවකගේ අයිතීන් සුරක්ෂිත කරනු වස් මානව හිමිකම් කොමිෂන් සභාවේ සුවිශේෂ අත්පොත් තැබීමකි.

කටුනායක හා බියගම නිදහස් වෙළඳ කලාපයන්හි සේවකයන් මූලික කරගත් මෙම සමීක්ෂණ වාර්තාව කම්කරු අයිතිවාසිකම් තහවුරු කිරීමට ගත් මුල් පියවරක් ලෙස කිව යුතුමය.

මානව හිමිකම් කොමිෂන් සභාවේ පර්යේෂණ හා අධීක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම පර්යේෂණය සඳහා ඩාබිඳු සාමූහිකය තම සහයෝගය ලබා දුන් බව සතුටින් දැනුම් දීමට කැමැත්තෙමු. එම පර්යේෂණ වාර්තාවේ සම්පූර්ණ පිටපත මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. (https://www.hrcsl.lk/)

**ඒ අනුව පර්යේෂණයේ ප්‍රායෝගික නිර්දේශ කිහිපයක් කෙටියෙන් දැක්වීමට කැමැත්තෙමු.**

01. කම්කරුවන් ඇතුළු නිදහස් වෙළඳ කලාපයේ සියලුම පදිංචිකරුවන්ට නල ජලය ලබාදීමට කඩිනම් වැඩපිළිවෙලක් සැකසීම.
02. මිනිස් බල සේවකයන්ගේ ගැටලු සම්බන්ධයෙන් උපදෙස්, උපදේශන සහ මඟ පෙන්වීම ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් පත් කිරීම.
03. තාවකාලික පදිංචිකරුවන් පිළිබඳ තොරතුරු, ආපදා කළමනාකරණ වාර්තා තබා ගැනීමේ සහ දත්ත පද්ධතියට ඒකාබද්ධ කිරීම සහ ආපදා අවස්ථාවන්හි දී තාවකාලික පදිංචිකරුවන් සහන වැඩසටහන් වලට ඇතුළත් බව තහවුරු කිරීම.
04. කම්කරු දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම යටතේ තාවකාලික සහ දෛනික වැටුප් ලබන සේවකයින් පිළිබඳ සවිස්තරාත්මක වාර්තා මිනිස් බල ආයතන විසින් පවත්වාගෙන යා යුතුය.
05. සේවකයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා අඛණ්ඩ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.

**මෙම නිර්දේශ කෙටි කාලීන වන අතර එමඟින් මූලික දැවෙන ප්‍රශ්න කිහිපයකට අවධානය යොමු කරමින් ක්ෂේත්‍රයේ ගැටලුවලට තිරසාර විසඳුම් සෙවීමට මූලාරම්භයක් ගැනීමට හැකිවනු ඇත.**

# ජීවිකාව ඔප්නැංවීම සඳහා පියවරක්



**පසුගිය** දෙසැම්බර් 06 වන දින ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම පිළිබඳව වන වැඩමුළුවේ එක් අදියරක් අවසන් කරන ලදි. මෙහි අරමුණ වූයේ කර්මාන්තශාලා වල නියුතු කාන්තාවන් සඳහා එම රැකියාවට අමතරව ආර්ථික වශයෙන් ශක්තිමත් මාවතක් සකසා දීමයි. මෙහි දී කාන්තාවන්ට අමතර ආදායම් මාර්ග හඳුන්වා දීමට සහ ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කිරීමට අවශ්‍ය උපාය මාර්ග සොයා ගැනීම සඳහා මූලික පියවරක් තබන ලදී. එමෙන්ම මෙම වැඩසටහනේ දෙවන අදියරේ පියවරක් ලෙස කිලිනොච්චියේ සහ වවුනියාවේ ශක්‍යතා තක්සේරු කිරීමක් පසුගිය දෙසැම්බර් 16 වන දින සිට 20 දක්වා දින වල දී වසර අවසානය සනිටුහන් කරමින් සිදුවිය.

# ජීවිතයට අලුත් ආලෝකයක්
## ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ අවබෝධතා වැඩසටහන




**ජනවාරි** මස 12 වන දින, ඩාබිඳු සාමූහිකය විසින් කම්කරු ලෝකයේ නව ආලෝකයක් ප්‍රකාශයට පත් කරමින්, වවුනියාව දිස්ත්‍රික්කයේ කර්මාන්ත වල සේවය කරන කාන්තා සේවකයින් සඳහා **"සෞඛ්‍ය අයිතිවාසිකම් සහ මානව හිමිකම්"** පිළිබඳ අවබෝධතා වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන ඔවුන්ගේ ජීවිත වලට අලුත්ම ආලෝකයක් විය. වඩා හොඳ, ශක්තිමත්, සෞඛ්‍යවත් ජීවිතයක් බලාපොරොත්තු වන සේවකයින්ට, එය වඩා අර්ථවත් සහ පැහැදිලි වන පරිදි වෛද්‍ය අරුල්මොලී මහත්මිය සහ ශ්‍රීදේවී මහත්මියගේ විශේෂ දේශනාවලින් පැහැදිලි විය.

මෙහිදී කාන්තා ලිංගික, ශාරීරික සහ මානසික සෞඛ්‍යය පිළිබඳව අවධානය යොමුකරමින්, ජීවිතයට අලුත් මනෝභාවයක් ලබා දුන්නේය. පෝෂණය, සෞඛ්‍ය අයිතිවාසිකම්, ලිංගික සම්බන්ධතා සහ ගෘහස්ථ හිංසනය සම්බන්ධව කලාත්මක හා විචාරාත්මක දැක්මක් ලබා දීමට මෙන්ම සෞඛ්‍යමය හා ආරක්ෂිත අලුත් අවකාශයක් නිර්මාණය කිරීමට ආරම්භයක් වුණි. මෙම වැඩසටහන වැඩ කරන කාන්තාවන් වඩාත් ශක්තිමත් කිරීම සඳහා මූලික වූ වැඩසටහනක් ලෙස පෙන්වා දිය හැකිය.



# සහෝදරත්වයේ කවය තුළින් කාන්තාවන්ට සෞඛ්‍ය අවබෝධය



සහෝදරත්වයේ කවයට මුල පිරීමක් ලෙස 2024 දෙසැම්බර් මස 8 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ කර්මාන්තශාලා වල කාන්තාවන් 25 දෙනෙකු තෝරාගෙන සහෝදරත්වයේ කවය දියත් කිරීම සඳහා දෙවන පෙළ නායිකාවන් ලෙස දැනුවත් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය Grassroot Trust හි පබා දේශප්‍රිය මහත්මිය විසින් ලබා දෙන ලදී.

2025 ජනවාරි 5 වන දින, ඩාබිඳු සමූහිකය විසින් කටුනායක කාන්තාවන්ගේ සමාජ සවිබල ගැන්වීම වෙනුවෙන් සහෝදරත්වයේ කවයක් සංවිධානය කරන ලදී. මෙහිදී කාන්තාවන් මුහුණ දෙන විශේෂ ගැටලු පිළිබඳ අවධානය යොමු කරමින්, ඔවුන් අතර සහයෝගය වර්ධනය කිරීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන, ඩාබිඳු සාමූහිකයේ දෙවැනි පෙළ නායකත්වය දැක්වූ නායකයින්ගේ මඟපෙන්වීමෙන්, සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

මෙම සාකච්ඡාවේ ප්‍රධාන මාතෘකාව වූයේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යයයි. සමාජයේ සම්ප්‍රදායික වශයෙන් කතාවට පවා අකමැති මෙම විෂය කාන්තාවන්ගේ සුභසාධනයට අත්‍යවශ්‍ය වන අතර, ඒ පිළිබඳව අවබෝධය වඩවාලීමේ තීරණාත්මක පියවරක් ලෙස මෙය සැලකිය හැකිය.

මෙය විවෘත සංවාදයක් ලෙස ක්‍රියාත්මක වූ අතර, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ද කාන්තාවන්ට අවබෝධය ලබාදීමට මඟ පෙන්විය. විශේෂයෙන්ම පළමු ඔසප් දිනයේ අත්දැකීම්, ඒ හා බැඳුණු චාරිත්‍ර, මිත්‍යා මත, රැකියා ස්ථානයේ ආරක්ෂාව හා ඔසප් දරිද්‍රතාව ගැන මෙහිදී සාකච්ඡා කරන ලදී. සහෝදරත්වයේ කවය, කාන්තාවන්ගේ දැනුම හා එකමුතු වීම මගින් ඔවුන්ගේ ජීවිත වෙනස් කර ගැනීමට මඟ පෙන්වන විශේෂ අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකිය.



# සේවක ගැටලු සඳහා තිරසාර විසඳුම් සාකච්ඡාව වවුනියාවේ පාර්ශවකරුවන්ගේ හමුව

ඩාබිඳු සාමූහිකය විසින් වවුනියාවේදී පාර්ශවකරුවන් සමඟ විශේෂ සාකච්ඡාවක් පවත්වමින් සේවකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටලු ප්‍රකාශයට පත් කරන ලදී. කම්කරුවන්ගේ ආරක්ෂාව, අධික වැඩබර, සහ වැටුප් ගැටලු ආදී විෂයයන් පිළිබඳ සාකච්ඡා අතර, ප්‍රතිපත්ති සැකසීමේ දී සේවක මත ඇතුළත් කිරීමේ වැදගත්කම ද මෙහිදී අවධාරණය විය. මෙම හමුව, සේවක අයිතිවාසිකම් රැක ගැනීමේ දිශානතියකට සෑම පාර්ශවයකගේම අවධානය යොමු විය.



# සංක්‍රමණික ශ්‍රමය පිළිබඳව වාර්තාව එළි දැක්වීම

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය විසින් පවත්වන ලද සංක්‍රමණික ශ්‍රමය පිළිබඳව වාර්තාව එළි දැක්වීමට ද ධාබිඳු සාමූහිකයේ අධ්‍යක්ෂිකා චමිලා තුෂාරි මහත්මිය සහභාගී විය. 2008 වසරේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ වූ අතර එය 2025 ජනවාරි මස අවසන් කරන ලදී. එම වාර්තාව එළිදැක්වීමට සංක්‍රමණික සේවකයින් සඳහා කටයුතු කරන සංවිධාන, සිවිල් සංවිධාන මෙන්ම ප්‍රතිපත්ති සංවිධායකයින් ද සහභාගි විය. මෙහිදී ධාබිඳු සාමූහිකය සංක්‍රමණික සේවකයින්ගේ ප්‍රතිපත්ති සම්පාදන අත්පිටපත සම්පාදනය කිරීම සඳහා දායකත්වය සපයන ලදී.

# ආසියානු කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිති රැස්වීම

ධාබිඳු සාමූහිකය, තායිලන්තයේ බැංකොක් නුවර රැස් වූ ආසියානු පොදු වැටුප් ව්‍යාපාරයේ (AFWA) කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිති කමිටු රැස්වීමේ දී ශ්‍රී ලංකාවේ කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිතිවල ප්‍රගතිය වාර්තා කළහ. මේ සඳහා ශ්‍රී ලංකාව, බංගලාදේශය, කාම්බෝජය, පාකිස්ථානය, ඉන්දුනීසියාව, සහ ඉන්දියාව යන රටවල් හයක් එක්වී එක් එක් රටවල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. එහිදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ධාබිඳු සාමූහිකය සහ නිමි භාණ්ඩ රෙදිපිළි හා ඇඟළුම් සේවක සංගමයේ නියෝජිතයන් මෙයට සහභාගි විය.




# උපාය මාර්ග සැලැස්ම සමාලෝචනය - SAAPE

ජාත්‍යන්තරව, නේපාලයේ පැවති දරිද්‍රතාවය තුරන් කිරීම පිළිබඳ දකුණු ආසියානු සන්ධානයේ උපාය මාර්ගික සැලසුම් සමාලෝචන රැස්වීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ධාබිඳු සාමූහිකය එයට සහභාගි විය. මෙම උපාය මාර්ග සමාලෝචනය, දෙසැම්බර් මස 20 සහ 21 දෙදින පැවැත්වූ අතර මෙහිදී කාන්තා අයිතිවාසිකම්, ආහාර සඳහා ඇති අයිතිය, සහ ආහාර ස්වෛරීභාවය, කම්කරු අයිතිවාසිකම් සහ ආර්ථික යුක්තිය යන අංශයන් හි එළඹෙන අවුරුදු පහ සඳහා සැලසුම් සකස් කිරීම සහ අභියෝග හඳුනාගැනීම සිදුකරනු ලැබීය.

# සංවර්ධනය තුළ කාන්තා අයිතිවාසිකම් සංසදය (AWID) - 2024



සංවර්ධනය තුළ කාන්තා අයිතිවාසිකම් (AWID) -2024 සංසදයේදී ඩාබිඳු සාමූහිකය ප්‍රධාන තැනක් ගත්තේය. එහි දී ඩාබිඳු සාමූහිකයේ මධුලිකා ගුණවර්ධන මෙනවිය ආර්ථික අයිතිවාසිකම් පිළිබඳ රැස්වීමක දී අසාධාරණ රාජ්‍ය ණය අහෝසි කිරීම සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදු වැඩසටහන අවසන් කිරීම ඉල්ලමින් මැදිහත් විය.

# එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජීය කමිටු රැස්වීම - (Asia Pacific)




ඩාබිඳු සමුහිකය, නීතිය හා සංවර්ධනය පිළිබඳ කාන්තාවන් සඳහා වූ ආසියා පැසිෆික් සංසදයට සහභාගී වූ අතර (APWLD) එහි දී මධුලිකා ගුණවර්ධන මෙනෙවිය විසින් එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජීය කමිටු (UN ESCAP) රැස්වීම ඇමතූ අතර රාජ්‍ය වියදම් කප්පාදුව අවසන් කිරීම සහ ගෝලීය දකුණු රටවල ප්‍රජාවන්ට තීරණ ගැනීමේ බලය ලබා දීමත්, ජනතාවත් සහ පරිසරයත් පදනම් කරගෙන සංවර්ධන යුක්තිය ක්‍රියාත්මක කළ යුතු බවත් අවධාරණය කළාය. මෙම උත්සාහයන් කම්කරුවන්ගේ හඬ විස්තාරණය කිරීමට සහ ගෝලීය වශයෙන් සමානාත්මතාවය ඉදිරියට ගෙන යාමට ඩාබිඳු සමුහිකයේ කැපවීම ඉස්මතු කරයි.



# සංස්කෘතික ගැහැනියගෙන් ඔබ්බට

ජනගහනයෙන් බහුතරය වූ කාන්තාව විසින් සිදුකරන තේරීමක් නොවූ ජීව විද්‍යාත්මක සංසිද්ධියක් වූ 'ඔසප් වීම' ගෞරවනීය වීම තුළ ඇත්තේ කාන්තාවන්ට ලබා දෙන ගෞරවය ය, කාන්තා අයිතිවාසිකම් සුරැකීමය. ඔසප් වීම තුළින් සිදුවන ජීව විද්‍යාත්මක සංසිද්ධිය නිවැරදිව දන්නේ මිනිසුන් කීයෙන් කී දෙනාද? යන්න ද පැනයකි. නමුත් එම ජීව විද්‍යාත්මක සංසිද්ධිය හේතු කොටගෙන කාන්තාවන් ආන්තීකරණයට, කොන් කිරීමට බොහෝ මිනිසුන් ඇති බව නොරහසකි.

ඔසප් වීමේ ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය නොදන්නා බොහෝ දෙනා ගැහැණු දරුවකුගේ පළමු ඔසප් වීම උත්සවශ්‍රීයෙන් සැමරීම දැක තිබෙනවාට අසා තිබෙනවාට සැක නැත. එම උත්සවශ්‍රීයෙන් සැමරීම පිටුපස ඇති මූලික හේතු පිළිබඳ විවිධ පිරිස් විවිධ මත දැරුවත් සංස්කෘතික වශයෙන් පරම්පරාවෙන් පරම්පරාවට ඒවා පැවතගෙන එන්නකි. එයටම ආවේණික වූ චාරිත්‍ර වාරිත්‍ර ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙන වෙනස් මුහුණුවරක් දරමින් කාලයක් තිස්සේ අප අතරම දක්නට ලැබේ. එම චාරිත්‍රයන් පිළිබඳ විශ්ලේෂණයක් විවේචනයක් අවශ්‍යව නැතත් එම චාරිත්‍ර මොනවා දැයි අවමයෙන් හෝ අප දැන ගැනීම ඉතා අගනේය. ප්‍රදේශයෙන් ප්‍රදේශයට නොදක්වමින් පොදුවේ චාරිත්‍රයන් දැක්වීම තුළ ඇත්තේ පොදු අවබෝධයට මග සැලසීමකි. මෙය හුදු අර්ථ දැක්වීමක් නොව කාන්තා කණ්ඩායම් හා සිදුකළ සාකච්ඡාවක සාරාංශයකි.

පළමු ඔසප් වීමේදී බොහෝ ප්‍රදේශවල විවිධ සංස්කෘතීන්ට අනුව ගැහැණු දරුවාගේ හඳහනට අනුව නැකත් ලබා දී එතෙක් පිරිමි පාර්ශවයේ ඇස නොගැටෙන පරිදි කාමරයක සතියක සිට මසක කාලයක් දක්වා රැඳී සිටීමට සිදු වේ. ඒ අතරේ පළමු ඔසප් වීම සිදුවන විට ඇඳ සිටි ඇඳුම මාසයක කාලයක් පුරා ඇඳ සිටීම ද සිදුවන අවස්ථා පවතී. තවදුරටත් පළමු ඔසප් වීමේදී ඇඳ සිටි ඇඳුම් මුට්ටියකට බහා වළ දැමීම ද බොහෝ ප්‍රදේශවල දක්නට ලැබිණි. තවද ඇණ වැනි යකඩ ලබාදීම තුළින් තනිකම නැති කිරීම අරමුණු කරයි. එපමණක් නොව මස් මාංශ වලින් තොරව ආහාර ලබාදීම පමණක් නොව තල තෙල් සහ බිත්තර ආහාරයට ලබාදීම ද බොහෝ ප්‍රදේශවල දක්නට ලැබිණි. තව ද නැකත් දිනයේදී කිරි ගහකට කෙටීම, පොල් බිඳීම ද, චාරිත්‍රානුකූලව නෑවීම ද, ලුණු නොමැති කිරිබත් සාදා එමඟින් ගැහැණු දරුවාගේ පිට තැවීම වැනි චාරිත්‍ර වාරිත්‍ර සිදු කරයි.

පළමු ඔසප් වීම හා බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ඇති අවබෝධය තුළින් එහි ගැබ්ව ඇති මිත්‍යාව හෝ ජීව විද්‍යාත්මක පදනමක හරය සේවීමට නව මානයක් විවර වේ. මෙපමණකින් පමණක් නතර නොවී කාන්තාවන් ආන්තීකරණයට, කොන් කිරීමට බොහෝ මිනිසුන්ගේ ඇති චර්යාවේ වෙනසකට මග පෑදේ නම් ඉතා අගනේය. ගෞරවනීය ඔසප් වීමට ලබා දිය හැකි පහසුම පියවර මෙලෙස අරඹමු.

යසාරා විදුමිණී

# සිතුවිල්ල

අනේ සෝමා දැන්වත් අපට කලක් යයිද? අපේ අයිතීන්, ශ්‍රමයට සරිලන වැටුපක් ලබාගන්න අපගේ වහල් සේවය නිවහල් කර ගන්න හැකිවෙයි නේද? මෙවර පාර්ලිමේන්තුවේ කාන්තාවන් විස්සක් පත් වෙලා කියන්නෙ. ඒකනේ, සිතූ දේ නොම වෙයි නොසිතූ දෙයක් වෙයි, ලොව දම් කැරකෙනවා කියලා කියන්නෙ. නොසිතූ දේ උනාට අපට මක් වෙයිද දන්නේ නෑ. මේ කලාපයට එන්ටර්වෙලා වසර ගානක් වෙනවා. තවමත් අපට ශ්‍රමයට ගතමනාවක් ලැබෙනවද?


ඔය කවුරු දියවන්නාවට ගියත් අපිට වැඩක් නැහැනේ. අපේ ශ්‍රම බලකාය ගැන නෝ කතා. තවම පටන් ගත්තා විතරනේ. ඒ වුණාට රාජ්‍ය අංශවල සේවය කරන අයට නම් වැටුප් වැඩි වෙනවා. අපි ඉතින් වැඩ්ඩෝ නෙවෙයිනේ. ඇගළුම් නේ. ඒකත් ගැලවිලා ගියදාට හුප්පෙ තමයි. ඔහොම යමු නංගි.

පේෂිට් එක අතට ගත්තම මල පනිනව අනේ. හැම එකෙන්ම කපලා. අපේ කොන්ඩෙ දිග වැඩියි කියලා ඒකත් කපයිද මන්දා. වසර ගණනාවක් මේ කලාපයේම ගත කරලා වයස ගිහින් බඳින්න වෙන්නේ වයසක පොරක් තමයි. එයත් කලාපයෙන් පිට හොයයිද දන්නේ නැහැ. ඇයි ඉස්සර එහෙම ඒවත් තිබුණානේ.

ගමේ ගියොත් හොඳයි කියලා හිතෙනවා. කලාපයේ ඉඳලා එපා වෙලා. බඩු වල මිලත් පාලනයක් නැහැ. වෙළෙන්දෝ හිතුමනාපෙට බඩු විකුණන්නෙ. පාලන මිලක් නැහැ. දේශපාලනය අතර ඇති මතභේදයක් නිසා ඒ දවස්වල ඇමති කෙනෙක් කියලා තිබුණේ 2500 ට කන්න පුළුවන් කියලා. එයාට මඤ්ඤං වෙන්න ඇති. දැන් නම් කුස්සියේ බර දන්නා පිරිසක්නෙ දියවන්නාව තරණය කරලා තියෙන්නේ. ඒ නිසා අපිටත් යම් සහනයක් ලැබෙයි. ලැබූ නව වසරේදිවත් වැඩිපුර කාන්තා නියෝජනයක් පාර්ලිමේන්තුව තුළ සිටින නිසාත් පවුලේ කුස්සියේ වැඩි බර දරන්නෙත් කාන්තාවන් නිසාත් පක්ෂ දේශපාලනයෙන් තොර සාමකාමී රටක් බිහිවේවා යැයි ඉත සිතින් පතමු.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 49



### හරහට

1. සේද සළු වියන්නේ මේ සතාගෙනි.
3. මැක්සිම් ගෝර්කිගේ ප්‍රකට කෘතියකි.
5. මිනිස් යන්නට සමාන පදයකි.
6. කාන්තාරයකි.
7. සමාජ ධර්මතා වලට එරෙහිව කටයුතු කරන්නා.
9. ළගම හිතවතා මෙසේ හඳුන්වයි.
11. බක් මාසයේ දක්නට ලැබෙන පක්ෂියෙකි.
13. ආලෝකය ලබා ගැනීමට උපකාරී වේ.
15. සංචාරක පුරවරයකි.
17. මැදුර යන අරුත ගෙන දේ.
19. සිංහල සාහිත්‍යයේ කාන්තා පියයුරු සමාන කර ඇත්තේ.
20. හොඳට නරකට දෙකට හේතුව.

### පහළට

2. පුදුම හතෙන් එකකි.
4. උත්තරයට මෙසේ කියයි.
6. කනට සමාන පදයකි.
8. ලංකාවට ආසන්නතම රටකි.
10. මෙය රන් හා වටී.
12. ඇදුම් මසන්නිය මෙනමින් හඳුන්වයි.
14. ජයග්‍රාහකයන්ට හිමි වේ.
16. කාව්‍ය ලෝකයේ රසබර කවියෙකි.
18. ප්‍රධාන ආයෝජන කලාප දෙකක් සහිත පළාත.
21. සත්තව උද්‍යානයකි.

**මෙම ප්‍රහේළිකාව නිවැරදිව පුරවා පහත සදහන් ලිපිනයට ඒවා මුදලින් රු.1000 ක් වටිනා තෑගි දිනාගන්න.**

**ඩාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**
**දුරකථන අංකය: 077 725 9892**

# සිසුවිය වන්නම

පන්තියේ විමසා බැලුවම දොස්තරලා වෙන්න
ඒ ටික බැරි නම් සමහරු නෝමල් ඩිග්‍රියයක් ගන්න
ඒ අය හමුවෙන්නට සිදුවේ කටුනායකට යන්න
බේත් හේත් ගන්න නොවේ උන්ගේ ලෙඩට බෙහෙත් දෙන්න

බොටනි කෙමිස්ට්‍රික් සුලොජි හැර වෙන කිසිවක් නොදන්න
භෞතික විද්‍යාව තමයි පංතියේ කා කාහටත් තිත්ත
සුදු කොළයට පෙළපාළිය යනකොට ඔබ දැකපු පැත්ත
දැන් තේරෙයි ජූකී මැසිමේ මැසිම් මසනාවිට නියම ඇත්ත


උදේ නැගිට පෝලිමේ හිඳ මුහුණ හෝදාගත් තැනේ සිට
ලිපිට පෝලිමයි ඊළඟ පෝලිම ඇත වැසිකිලියට
බත් පත බැඳ පොල් සම්බල කරවල හොදි කා හනිකට
වැඩපළ වෙත දිව යන ඇය පත් වී ඇත අපා දුකට

නිවාඩු දා හතරක් ඇත ඒවා කරන්නට නැති දාටයි
අවමගුලට උඹල ගියයි මිනියට පණ එන්නේ නැතිලු
මව් මැරුනත් වෙනසක් නෑ තීරණේ සුපර්වයිසර් ගෙලු
විදුලි පුවත අතට දෙද්දි සත් දින දානෙත් ඉවරලු

කන්නෙ පොලිතින් බත් මුල බොන්නෙ ක්ලෝරීන් ජල නල
ඒත් කාරි නෑ ඉවසනු බැරි ඇන්ටිගේ බෝඩිං බිල
වැටුපෙන් බෑ පිරිමහන්න අහස උසට නැගී බඩු මිල
ගෙදර ගියොත් මේකත් නෑ එනිසයි නැත්තේ කලබල

බලන්න එන මනමාලයන් කලාපෙ නම් බෑ කියනවා
මුවන්දම් ද සුව යහන්ද නෑ මේ අය දිරලා යනවා
දෑ වැදි නොව කන්නත් නෑ සිතත් කයත් දුබලවෙනවා
අනේ අනිච්චම් මේ අය කලාපෙටම නාකි වෙනවා

රංජිත් ගුණවර්ධන



# සෑම සේවකයෙකුගේම මූලික අයිතිවාසිකමක් වන සමාජ ආරක්ෂාව

සමාජ ආරක්ෂාව යන්නෙන් අදහස් කරනුයේ සේවකයෙකුගේ මූලික අයිතිවාසිකම්වල කොටසක් වන ශක්තිමත් සහ වඩාත් සාධාරණ සේවා ස්ථානයක් සඳහා පාදක වන ආරක්ෂිත පියවරයන් ය. එම පියවරයන් අතර විරැකියා රක්ෂණය, අසනීප වැටුප්, සමාජ සුරක්ෂිතතාවය, සහ වෙන්කිරීමේ වැටුප් ඇතුළත් වේ.

ලොව පුරා මිලියන සංඛ්‍යාත සේවකයින් සේවයේ නිරත වෙමින් සිටින රෙදිපිළි සහ ඇඟළුම් අංශ, සංවර්ධනය වෙමින් පවතින රටවල අස්ථිර රැකියා සඳහා විශාල ප්‍රභවයකි. මෙම අංශය ප්‍රධාන වශයෙන් අඩු වැටුප් සහිත සේවකයින්ගෙන් සමන්විත වන අතර ඔවුන් බොහෝ දුරට කෙටි කාලීන කොන්ත්‍රාත්තු මත සේවය කරන තරුණ කාන්තාවන් සහ අභ්‍යන්තර සංක්‍රමණිකයන් වේ.

කොවිඩ්-19 වසංගතයේ දී, විශේෂයෙන්ම ඇඟළුම් අංශයේ, කම්කරුවන් දැඩි ලෙස පීඩාවට පත් වූ අතර ඔවුන් මුහුණ දෙන අවදානම හෙළි කළේය. නිෂ්පාදන මාර්ග මන්දගාමී වීම සහ රැකියා අතුරුදහන් වීමත් සමඟ, කම්කරුවන් මිලියන ගණනක් ආරක්ෂිත රැකියාවක් නොමැතිව සිටියහ. මෙම අර්බුදය ලොව පුරා කම්කරුවන් සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂාවක හදිසි අවශ්‍යතාවයක් අවධාරණය කළේය.

මෑත කාලයේ දී, බංගලාදේශයේ කම්කරු හා රැකියා අමාත්‍යාංශය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ සහයෝගයෙන් රැකියා සුරක්ෂිත යෝජනා ක්‍රමයක් සඳහා නියමු වැඩසටහනක් දියත් කළ අතර එය රටේ නිමි ඇඳුම් සේවකයින් මිලියන හතරක් ආවරණය කරයි. එය වෛද්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපන සේවා සඳහා වන්දි මෙන්ම වෘත්තීය අනතුරු සහ රෝග නිසා ඇතිවන ආදායම් අහිමිවීම ඇතුළත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයකි.

සමාජ ආරක්ෂාව සහතික කිරීමේදී වෘත්තීය සමිති, රජයන් සහ වෙළඳ නාම සියල්ලටම ප්‍රධාන කාර්යභාරයක් ඇති අතර සාධාරණ වැටුප් සහ ආරක්ෂිත සේවා කොන්දේසි සුරක්ෂිත කිරීමේ සිට දිගුකාලීන තිරසාරභාවය ගොඩනැගීම දක්වා සාමූහික ක්‍රියාමාර්ග වලට ද පෙළඹිය යුතුය. ශ්‍රී ලංකාව වශයෙන් අප ද සෑම සේවකයකුගේම මූලික අයිතිවාසිකමක් වන සමාජ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා හැකි ඉක්මනින් පියවර ගත යුතුය.

(https://www.industriall-union.org/the-case-for-social-protection වෙබ් අඩවියෙන් උපුටා ගන්නා ලදී)



# විශිෂ්ඨත්වයට පියනගන දෑත්

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රය පෙන්වා දිය හැකිය. ඔවුන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන ප්‍රමුඛ පෙළේ පිරිසකි.

කෙසේ වෙතත් ඔවුන් මුහුණ දෙන අභියෝග මැඩ පවත්වන, ඔවුන්ගේ අයිතිවාසිකම් රැකබලා ගන්නා සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන වෘත්තීය නායකත්වයක් මතුවීම අත්‍යවශ්‍ය වන අතර ඩාබිඳු සාමූහිකයේ අවධානය ඒ සඳහා යොමු විය.

කර්මාන්තවල සේවය කරන කාන්තාවන්ගේ වැඩ අහිමි වීම, වැඩ කරන ස්ථානයන්හි හිංසනය සහ සෞඛ්‍ය අභියෝග මත බලපෑම ඇති කිරීම මෙන්ම ඔවුන්ගේ ගැටලු නිවැරදිව හඳුනාගෙන, ඒ සඳහා විසඳුම් ලෙස වෘත්තීය සහ නීතිමය පියවර ගැනීමට මගපෙන්වීමක් ලෙස නායකත්ව පුහුණුවක් ලබා දීමට ඩාබිඳු සාමූහිකය තීරණය කරන ලදී. මෙහිදී ඔවුන්ගේ ප්‍රජාවන්ට සහ පවුල් වලට ආර්ථික සහ සමාජීය වටිනාකමක් ලබා ගැනීමට ද හැකිවනු ඇත. එමෙන්ම මෙහිදී කාන්තාවන් තම හැකියාවන්, හැසිරීම්, තීරණ ගැනීමේ කුසලතා සහ කණ්ඩායම් කළමනාකරණය වර්ධනය කිරීමට ද හැකිවේ. මෙලෙස ඩාබිඳු සාමූහිකය මඟින් වවුනියා හා කිලිනොච්චි ප්‍රදේශවල කාන්තාවන් 25 දෙනෙකු සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

එම ප්‍රතිඵලයේ මෑතකාලීන නිදර්ශනයක් ලෙස එක් කර්මාන්ත ශාලාවක ආපනශාලාව මඟින් ලබාදෙන ලද කෑම පරිභෝජනයට නුසුදුසු ඒවා විය. එයට එරෙහිව කටයුතු කිරීම සඳහා නායකත්ව පුහුණුව ලබාගත් කාන්තාවන් එක්ව අනෙකුත් සේවක සේවිකාවන්ද සමඟින් සිය නිවෙස් වලින් කෑම ගෙන එන ලදී. මෙය සතියක පමණ කාලයක් සිදු කරන ලද අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස පරිභෝජනයට සුදුසු ආහාර වේලක් ලබාදීමට කර්මාන්තශාලාව විසින් කටයුතු කරන ලදී. මේ ඩාබිඳු සාමූහිකය ලබාගත් ජයග්‍රහණයක් ලෙස පෙන්වාදිය හැකිය.

අංක: 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.